බිංගිරිය ප්‍රාදේශීය සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බිංගිරිය ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට බිංගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව** වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 **පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූල නොවීම.**

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
සභාව විසින් පවරා තිබුණු නඩු 05 ක් පැවතුණ අතර ඒ වෙනුවෙන් රු.106,670 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. මේ නඩු පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	පාලනය කළ නොහැකි හේතුන් මත මෙම නඩු කටයුතු තවදුරටත් නොවිසඳෙන ආකාරයට පවත්වාගෙන යාමට සිදු වී ඇති බව.	බාහිර පාර්ශවයන් සමඟ එළඹ තිබුණු ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.

1.6.2 **ගිණුම්කරණ අඩුපාඩු**

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ රු. 147,500 කට මිලදී ගෙන තිබුණු ඇඳි සහිත ප්ලාස්ටික් පුටු 50 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.	2025 වර්ෂයේ අවසන් ගිණුම තුලින් මෙම අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද බෙහෙත් තොග වටිනාකම ගණනය කර අවසන් තොගයට ඇතුළත් කර නොතිබුණි.	2025 වර්ෂයේ අවසන් ගිණුම තුලින් මෙම අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	වටිනාකම රු. 20,300 ක් වූ ගබඩා තොග අයිතම 04 ක වටිනාකම ගිණුම්ගත නොකිරීම තොග අයිතම 6 ක වටිනාකම රු.74,251 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම සහ තොග අයිතම 12 ක වටිනාකම රු.652,991 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේ අවසන් ගිණුම තුලින් මෙම අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති.රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම ,රීති ,

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූලනොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති			
	218 රීතිය	පත්කළ මණ්ඩලයක් විසින් වාර්ෂික ඉඩම් ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදු කලයුතු වුවද එසේ සිදුකර නොතිබුණි.	ඉදිරියේ දී ප්‍රාදේශීය සභාව සතු වත්කම් පිළිබඳව සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන බව.	රීති අනුව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i)	මුදල් රෙගුලාසි 371	තත්කාර්ය අතුරු අග්‍රිමය කාර්යය නිම කළ විගස පියවිය යුතු වුවද 2013 වසරට පෙර ලබා දුන් අත්තිකාරම් රු.357,656 ක් හා වසර ගණනාවක සිට පැවත එන රු. රු.804,925 ක හඳුනා නොගත් අත්තිකාරම් ශේෂයක් පැවතුණි.	පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(ii)	මු.රෙ 571 (2)	වටිනාකම රු.124,136 ක් වූ ඉකුත් තැන්පතු 05 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉකුත් වූ තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටින බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ			
	2022 පෙබරවාරි 25 දිනැති අංක 1/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය	සභාවේ වාහන 06 ක් සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.	කඩිනමින් එම අඩුපාඩු සකසා ගැනීමට කටයුතු කරන බව.	චක්‍රලේඛ අනුව ආදායම් බලපත්‍ර ලබා ගත යුතුය.

(ඇ)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද වත්කම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛය හා කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශය. 2 වන වගන්තිය	රජයේ මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී ඒවායේ වටිනාකම නිවැරදිව ගණනය කළ යුතු වුවද , සභාවේ වාහන හැර අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කර නොතිබුණි.	මීට අදාළව මූලික කටයුතු ආරම්භ කර ඇති අතර තක්සේරු කමිටුවක් ද පත් කොට ඇති බව.	මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය.
(ඉ)	2010 ජූලි 30 දිනැති අංක 2010/02 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය	සියලුම වත්කම් පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් පැවැත්වීම , නියමිත වත්කම් ප්‍රමාණ තිබේදැයි ඉඩම් මැන තහවුරු කිරීම සිදු කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සභාව සතු ඉඩම් 106 කින් ඉඩම් 17 ක පමණක් සමීක්ෂණ සිදුකර තිබුණි.	සභාව සතුව පවතින සියලු වත්කම් පිළිබඳව 2025 වසර තුල සමීක්ෂණය කිරීමට කටයුතු කරන බව.	සියලු වත්කම් සමීක්ෂණය කර අයිතිය හා පැවැත්ම තහවුරු කළ යුතුය.
(ඊ)	වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය විසින් ප්‍රජා මූල සංවිධාන සඳහා හඳුන්වා දී ඇති මාර්ගෝපදේශයේ 2.2.2. (iv) ඡේදය හා 9.2 (v) ඡේදය	ප්‍රජා මූල සංවිධානවල සම්මත වූ වාර්ෂික අයවැය වාර්තාවේ පිටපත් සභාව වෙත ගෙන්වා නොගැනීම. ප්‍රජා මූල සංවිධානවල ගිණුම් විගණනය සඳහා සභාව සහභාගී නොවීම ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි කරවීම සිදු නොවීම හා අධීක්ෂණය කිරීම සිදුකර නොතිබීම නිරීක්ෂණය විය.	ඉදිරියේදී කටයුතු කිරීමට පියවර ගන්නා බව.	මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.22,781,804 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.40,744,083 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතු බැංකු ජංගම ගිණුමට අදාල සැසඳුම තුල වසර 18 කට ආසන්න කාලයක සිට පැවත එන රු. 181,846 ක හඳුනා නොගත් වෙනස නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම හඳුනා නොගත් රු.181,846 ක වෙනස වසර 18 කට ආසන්න කාලයක සිට පැවත එන අතර පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන්ගෙන්ද සහය ලබා ගෙන නිවැරදි කිරීමට උත්සහ කළද එම තොරතුරු සොයා ගැනීමට නොහැකි වූ බව.	හඳුනා නොගත් බැංකු ශේෂය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය.

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ආදායම් රැස්කිරීමේ** කාර්ය සාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත කළ ආදායම රු.මිලියන 97.5 ක් වී තිබුණු අතර , එම ඇස්තමේන්තුගත මුදලින් බිල්කර තිබුණේ රු.මිලියන 09 ක් හෙවත් සියයට 9 ක් තරම් ඉතා සුළු ප්‍රතිශතයක් පමණි.	නිශ්චිතව බිල් කල නොහැකි එහෙත් මාසිකව රැස්කරගන්නා ආදායම බිල්කිරීම් වශයෙන් ලේඛන ගත කිරීම සිදුකර ඇතත් එම තොරතුරු අදාල වගුවේ සටහන් නොකිරීම, මෙයට හේතු වී ඇති බව.	නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායමට පසුගිය වර්ෂයේ අවසාන හිඟ ආදායම එකතු කර රැස්කළ ආදායම අඩුකල පසු දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම ලැබේ. ඉදිරිපත් කළ දත්ත අනුව මෙම සංඛ්‍යා අතර පරස්පරතාවයක් පවතින බව නිරීක්ෂණය කෙරේ.	ඉදිරිපත් කර ඇති තොරතුරුවල පවතින පරස්පරතාවය නිවැරදි කර ඉදිරිපත් කරන බව.	නිවැරදි දත්ත ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	**වරිපනම් බදු**		
	වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05 කට වරක් තක්සේරු දෙපාර්මේන්තුව ලවා කළ යුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කරගෙන වර්තමානයේදීත් වරිපනම් අය කරනු ලබන අතර තක්සේරුව කාලීනව සිදු නොකිරීමෙන් දේපලවල වර්තමාන තත්වය වෙනස්වීම මත ගණනය කළ නොහැකි වරිපනම් ආදායමක් සභාවට අහිමි වී තිබුණි.	වරිපනම් තක්සේරුව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් සිදු කර ගැනීම සඳහා 2024.05.29 දින ගාස්තු ගෙවා ගිවිසුම් අත්සන් කර තිබුණද මේ දක්වා සිදුකර නොමැති බව.	වසර 05කට වරක් වරිපනම් බදු තක්සේරුව සිඳු කළ යුතුය.
(ඇ)	**කුලී**		
	2024 දෙසැම්බර් 31 දිනට රු . 344,091 ක හිඟ ශේෂයක් අයවිය යුතුව පැවතුණි.	තවදුරටත් අයකරගත නොහැකි හිගයක් ලෙස වෙන් වෙන්ව හඳුනාගෙන බදුකරුවන් මියගොස් ඇති දේපළ වලට අදාල හිග මුදල් කපා හැරීම සඳහා වර්තමාන කාර්යමණ්ඩලය කටයුතු කරන බව.	හිග ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 පනතින් පවරා ඇති කාය්‍යර්යන් ඉටු කිරීම

විගණනනිරීක්ෂණය	සභාවේඅදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබුණු නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 28ක් වෙනුවෙන් සභාව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි	සභාවේ අවශ්‍යතාවය පරිදි වැළඳගත් අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කරන අතර මේ වන විට කොහු කර්මාන්ත නියාමනය කිරීමේ අතුරු ව්‍යවස්ථාව, සතිපොල අතුරු ව්‍යවස්ථාව හා බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පාරවල් හා මංමාවත් සම්බන්ධයෙන් වූ අවහිර වැළැක්වීම පිළිබඳව අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීමට අදාළව කටයුතු කරමින් පවතින බව.	අතුරු ව්‍යවස්ථා පනවා සභාවේ කටයුතු විධිමත් කිරීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාය්‍යර්ක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ වත්කම් විෂයයන් 05 ක හා වගකීම් විෂයයක උපලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු.32,638,324 ක වෙනසක් පැවතුණි. එම වෙනස්කම් නිරවුල් කිරීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශනවල සටහන් ගිණුම් විෂයන්ගේ ශේෂයන් අදාල උපලේඛනවලට නොසැසඳීම වර්ෂ ගණනාවකම සිට පැවත එන අතර 2025 මූල්‍ය ප්‍රකාශනයේදී විගණනයෙන් පෙන්වා දී ඇති සියලු ගිණුම් විෂයන්ගේ හා උපලේඛන අතර නොසැසඳීම් තවදුරටත් හඳුනාගෙන වෙනස අවම කර ගැනීමට හා නිවැරදිව ඉදිරියට පවත්වා ගෙන යාමට කටයුතු කරන බව.	ගිණුම් විෂයන්ගේ හා උපලේඛන අතර නොසැසඳීම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 05 ක රු.12,951,100 ක ශේෂයක් තිබුණු අතර ඒ තුල වසර 1 ත් 5 ත් අතර කාලයට අදාලව රු.12,208,795 ක ශේෂයක් හා වසර 05ට වැඩි රු.742,305 ක ශේෂයක් විය.	පවතින හිඟ ශේෂ අයකර ගැනීම සඳහා නිලධාරින්ට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් සිදුකර ඇති බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් 04 ක රු.74,483,604 ක ශේෂයක් වූ අතර ඒ තුල වර්ෂ 1 ත් 5 ත් අතර කාලයට අදාලව රු.65,398,868 ක් හා වර්ෂ 05 ට වැඩි රු.9,084,736 ක්ද තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි.	අදාල ශේෂයන් පරීක්ෂා කරමින් පවතින අතර පරීක්ෂා කර බලා පියවර ගැනීමට කටයුතු කරන බව.	පැවැත්ම හදුනාගෙන ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	සංවර්ධන සැලැස්ම අනුමත කිරීමකින් තොරව අක්කර 01 රූඩ් 01 පර්චස් 27.20 ක් වූ වැල්ලරාව පිහිටි කහටගහයාය ඉඩම කොටස් කර විකිණීම සිදු කර තිබුණි.	වෙන්දේසිකාර ආයතනය ඉඩම සංවර්ධනය කිරීම සඳහා 2021 ජූලි 06 වන දින අවශ්‍ය තොරතුරු සමඟ අයදුම් කර ඇති බවද ඒ සඳහා ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරි විසින් 2021 ජූලි 08 වන දින සංවර්ධන කොන්දේසි ලබා දීමට කටයුතු කර ඇති බව.	ඉඩම් කට්ටි කිරීමේ කටයුතු විධිමත්ව සමාලෝචනය කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වටිනාකම රු 3,206,000ක් වූ මෝටර් රථ හා කරත්ත, වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර යන්ත්‍රෝපකරණ හා මෝටර් රථවලට අදාලව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර නොතිබුණි.	මෙම දේපල වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරමින් සිටින බව.	වත්කම් ලේඛනය යාවත්කාලීනව පැවැත්වීමට කටයුතු කළ යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට සභාව සතු සුසාන භූමි 99 ක් පැවතියද එම සුසාන භූමි සභාව වෙත පවරා ගෙන නොතිබුණි.	සුසාන භූමි සම්බන්ධව තත්ත්ව වාර්තා ලබා දෙන ලෙසට ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයෙන් ඉල්ලීමක් කර ඇත. එම වාර්තා ලැබුණු පසු විධිමත් පරිදි ඔප්පු සැකසීමට අවශ්‍ය කටයුතු කරන බව.	සභාව නඩත්තු කරන සුසාන භූමි විධිමත් පරිදි සභාව වෙත පවරා ගත යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දින වන විටත් සභාව සතු වාහන 06 ක් සඳහා ලියාපදිංචි සහතිකය ලබා ගෙන නොතිබුණි.	ලියාපදිංචි කරගැනීමට අවශ්‍ය තොරතුරු නොමැති වීම නිසා මෙම වාහන ලියාපදිංචි කරගැනීමට නොහැකි වී ඇති බව.	සභාව සතු වාහන සඳහා ලියාපදිංචි සහතිකය ලබා ගත යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 23 ක් හා අතිරික්ත 20 ක් පැවති අතර පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් හා අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි .	මෙම අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් යොමු කර ඇති බව.	පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු අතර අතිරික්ත සේවකයන් අනුමත කරවා ගැනීමට ක්‍රියා කළ යුතුය.
(ආ)	වසර ගණනාවක සිට පැවත එන රු 249,853 ක හඳුනා නොගත් සේවක ණය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	හඳුනා නොගත් සේවක ණය පරීක්ෂා කර බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව.	අයවිය යුතු ණය ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ මුළු ප්‍රතිපදනය ලෙස රු.1,650,000 ක් වෙන් කරමින් සිදු කිරීමට සැලසුම් කර තිබුණු වැඩසටහන් 07 ක් වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	අදාළ අනුමැතිය නොලැබීම , රාජ්‍ය වියදම් පාලනය මත අත්හිටුවා තිබීම හේතු වූ බව.	අයවැය මඟින් ප්‍රතිපාදන සලසා ඇති හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත ව්‍යාපෘති ඉටුකළ යුතුය.
(ආ)	සභාව 2024 වර්ෂයට අදාළව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අයිතම 21 කට අදාල භෞතික ප්‍රගතිය සියයට 50 ට අඩු මට්ටමක පැවතුණි.	වැය විෂයන් 03ක් වැය ශීර්ෂ මාරු කර ඇති අතර ආණ්ඩුකාර අනුමැතිය නොලැබුණ බැවින් වැඩසටහන් 02ක් සිදු කර නොමැත. වැඩසටහන් 06ක් ණය හිමි කර ඇත. වෙන් කරන ලද ප්‍රතිපාදන සියල්ල වැය නොවූ නමුත් ඉතිරි වැඩසටහන් 10 සිදු කර අවසන් කර ඇති බව.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කළ යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් උපයෝජනයේ විචලතාවය සමස්ත වැයවිෂයයන් 154 කින් වැය විෂයයන් 91 කම, සියයට 50 කට වැඩියෙන් පැවතීම නිසා වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කිරීමේදී මුදල් රෙගුලාසි 50 (i), 50 (ii) හා 50 (iii) දැක්වෙන කරුණු කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර තිබූ බවක් නිරීක්ෂණය නොවීය.	වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී මුදල් රෙගුලාසි පිළිබඳ අවධානය යොමු කරමින් සකස් කිරීමට කටයුතු කරන බව.	වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙළ කළ යුතුය.

4.3 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030 අරමුණු ළඟාකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුල සැලසුම් කළ ව්‍යාපෘති 30 ක් අතුරින් ව්‍යාපෘති 13 ක් ඉටු කර නොතිබුණි.	වෙන් කළ වැය ප්‍රතිපාදන අනුව තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු කරා ළඟාවීමට ඉදිරියේදී කටයුතු කරන බව.	තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය.